කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023

2026 ජනවාරි/පෙබරවාරි

මානවශාස්ත්‍ර පීඨය

## සිංහල

(නව නිර්දේශය)

ශිලා ලේඛන, සංස්කෘතිය හා ජනශ්‍රැතිය

**SINH 38224**


පළමුවන කොටසේ පළමුවන ප්‍රශ්නය හා තවත් එක් ප්‍රශ්නයක් ද දෙවන හා තෙවන කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් බැගින්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

### I කොටස

01. (අ) පහත සඳහන් ශිලා ලිපි කියවා වර්තමාන සිංහල අකුරින් ලියන්න.



(ලකුණු 05 යි)

(ආ) පහත සඳහන් ශිලා ලේඛන පාඨයන්හි අදහස ලිහිල් බසින් ලියන්න.

බඩකරික - පරුමක - තිශ-පුත පරුමකශඩගුතහ ලෙණෙ

ගමණී - අබයශ කඩයය අබි - කණිය ලෙණෙ ශගශ
මතප(දසනෙ)

පරුමක-නමලි-ශුමන-පුත පරුමක - නමලිය ලෙණෙ ශගශ

උපශක - නගමිතහ බරියය උපශික - ශිලය ලෙණෙ
ශගශ

බතිය මනලිකචිය පුත පරුමක - අශමනහ ලෙණෙ ශගශ

(ලකුණු 05 යි )

(ඇ)

සි / පුවිය මහසෙන මහරජහ පුත සිරිමෙකවණ අබ
මහරජහ වත ලෙගි
-තක තිණවනක වසහි / නකරහි උතරපසහි කළහුමනක
තියමතනහි සිය අ-
-වීය කිණියෙනි තිකත කඩුබලගමකෙහි වසනක අමෙති
පහෙජ සිවය-
-හ පුත දෙවයහ යහිසපවය නවවහෙරකෙහි දින අරියව
-ස වටවි, දෙහකඩ දස අමණක වී ඉව ස අමණක
උදි ඉව බයලි දස අමණ ඉව / මෙදෙහකඩ දස අ-
-මණක වි පිටදඩහසහි වෙඩ අකලහසහි වෙඩ ම-
-දෙහසහි වෙඩ පවවිසිය අමණක වි ඉව

(ලකුණු 06 යි )

(ඈ)

පෙරෙකැමියන් ගම් දන්නා සෙ දඩ් ගෙනැ
පැට්වූ වරදව් වටාලා දඩ් නොගන්නා ඉසා ඇත්වෙහෙර
ගම්බිමින් ගත් හැමදඩ් ඇත්වෙහෙර කමින-
වාමට් දෙනු ඉසා පෙර තොවත් විරි තැනට් පෙරෙනාට්ටියම්
නොවද්නා ඉසා රට් පටවන්නට් ගිය රජ් කොල්
සම්දරුවන් ගත් දඩැ ගිගිරියක් ඇත සම්දරුවන්
දඩනායකයන් හිඳැ විවාරකොට් හැරියැ යුතුවක්
හර්නා ඉසා මිනිකොටා සඟුන් වත් තැනට් වත් කෙනෙකුන්
ඇත එහි පහළවනුද් මවුනුජ් විවාර කොට් දම්බ්
දිව් යවන්නට් හර්නා ඉසා සෙසු බියෙන් වත් කෙනෙකුන්
ඇත ගෙදඩ් නොගන්නා ඉසා දෙස් නොයවනු ඉ
සා රජ්කොලෙන් බහා බුජ්සස්නෙහි අනුසසැ බැඳැ දූත්
පමණු උදහසැ නොගන්නා ඉසා කැමිකම් කළවුත් ග
ම්පාට්ට වැළඳුවත් සඟුන් කරා වත විවාර කොට් ගතයුතු
ණයක් ගනුත් මුත් සෙසු නිගා නොකරනු ඉසා සඟු
ත් වාස කරන අවසැ රදොලෙන් යවාදිහි මිනිස්නට්
නවාතැත් නොගෙනැ දෙනු ඉසා සඟ් කළ අවස් පුහුල්
නොකර
නු ඉසා

(ලකුණු 08 යි )

(ඉ)

බදු මිනු ලහසියෙන් මි
-සැ සෙසු ලහසියෙ -
-න් නො මනනු ඉසා ග-
-ම් වත් බඩු ගැමැ වික්
-ක මිසැ ගෙනැයත් සූත්-
-වත් නො ගන්නා ඉසා (නො-)
පැ විකි බඩියෙහි දීණ
සූත්වත් ගනුත් මිසැ
ආකුල නො කරනු ඉසා
නොවැටු මදඩියෙන් (නො
යෙන්) නො කිරනු ඉසා සු-
-ත් බඩු නොතනැ හින්ද
නො විකුණනු ඉසා ස-
-ල් නොකළමනා තැනැ නො-
-කිරනු ඉසා සල් නො-
-කළමනවුත් නො කිරනු
ඉසා කුළමසු පුරවත්
වි මිසැ වැටෙන මසු
උනු කොට නො ගන්නා
කොට ඉසා

(ලකුණු 08 යි )

(ඊ) සිරිසඟ්බො අභය් මහරජ්හු සත් ලැගු (නව)ව
න හවුරුදුයෙහි උත්ද්වප් සන්ද් පෙරෙ අඩ් (ම)ස්හි ද(ස)
පක් දවස් උතුරු පසැ අම්ගම්කුළියෙහි කිබි(නිල)
මිහි දෙමෙල්වෙහෙර් පමණියෙන් දසගමට් එකෙක
නායකයන් කිබිගම් ඇපූ දූන් නායකයන් කුඩී
න් මෙහි ඇත්ලත්තාක් තැනැ කුහිවකු මරා කෙ(ටුව)
කඬපළා සොරකම් කළ තිරැ කොට් ගෙනැ දස ගැමැ ඇ
ත්තන් හින්දැ විචාරා උපන් දැයට් පෑ හැකිසේ ලියා
තබා මැරූඉවහු මරා පට්වනු කොට් ඉසා කඬපළා සොරු
න් ගත් අයතියෙන් නියතකළාක් අයිතිය (හි)මි
හට් ගෙන දී එල්වනු කොට් ඉසා තිරැ නොකළ දසගැ
මැ ඇත්තන් පන්සාලිස දවසෙකින් සොයා ගෙනැ පට්
වනු කොට් ඉසා සොයා නො ගත දස ගැමින් එක්
සිය පස්විසි කළන්දක් රන් රදොලට් දෙනු කොට් ඉසා
ඉනා මරා කෙටුව දිවිමිලැ පනාස් කළන්දක් රන් ගන්නා
කොට් ඉසා නො පොහොත් ගෙදඩ් ගන්නා කොට් ඉසා (ලකුණු 08)

02. අශෝක බ්‍රාහ්මී අක්‍ෂර මාලාව හා ශ්‍රී ලාංකේය අක්‍ෂර මාලාව පිළිබඳ ව තුලනාත්මක විග්‍රහයක් කරන්න.

03. පස්වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියෙන් ප්‍රතීයමාන වන රජය හා ආගම අතර පැවති සම්බන්ධතාව කෙබඳු වූවක් දැයි පහදන්න.

04. පහත සඳහන් මාතෘකා අතුරෙන් එකක් පිළිබඳ ප්‍රමාණවත් සටහන් සපයන්න.

(i) ලෙන්ලිපිවලින් හෙළිවන අතීත ශ්‍රී ලංකාවේ සමාජ හා සංස්කෘතික තොරතුරු

(ii) තෝණිගල ගිරි ලිපියේ ඓතිහාසික වැදගත්කම

(iii) වේවැල්කැටිය පුවරු ලිපියෙන් හෙළිවන අපරාධ මර්දන නීති

## II කොටස

05. ''සංස්කෘතිය යනු මිනිසා විසින් ප්‍රකෘති ලෝකය මත ගොඩනගන ලද කෘත්‍රිම පරිසරයයි.'' විමසන්න.

06. පුරාණ ජනයාගේ තාක්‍ෂණික ඥානය, සොබාදහම කෙරෙහි වූ සංවේදීතාව හා සංස්කෘතික ශික්‍ෂණය ශ්‍රී ලාංකේය වාරි සංස්කෘතියෙහි කෙසේ පිළිබිඹු වේදැයි පරීක්‍ෂා කරන්න.

නැතහොත්

පැරණි ගෘහස්ථ චාරිත්‍රවල පවතින සමාජ හා මානව විද්‍යාත්මක වටිනාකම කෙබඳු දැයි පහදන්න.

07. ලන්දේසි පාලන සමයේ සිංහල සංස්කෘතියෙහි සිදු වූ විපර්යාස කවරේදැයි නිදසුන් ඇසුරින් විභාග කරන්න.

## III කොටස

08. ජනශ්‍රැතිය යන්න නිර්වචනාශ්‍රයෙන් පැහැදිලි කොට ඊට අයත් වන විවිධ ප්‍රභේද හඳුන්වන්න.

09. ''වෘක්‍ෂශ්‍රැති මගින් පිළිබිඹු වන්නේ පුරාණ සිංහලයන් ශාඛ ප්‍රජාව සමග පැවැත්වූ විවිධ ස්වරූපයේ සබඳතා ය.'' විමසන්න.

10. ආගමික විශ්වාස මත පදනම් ව බිහි වූ සත්ත්ව ශ්‍රැතියෙහි විවිධ ස්වරූප නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

**(02 සිට 10 දක්වා සෑම පිළිතුරකට ම ලකුණු 15 බැගිනි)**

******************************

(ආ) පහත සඳහන් ශිලා ලේඛන පාඨයන්හි අදහස ලිහිල් බසින් ලියන්න.

බඩකරික - පරුමක - තිශ-පුත පරුමකශඩගුතහ ලෙණෙ

ගමණි - අබයශ කඩයය අබි - කණිය ලෙණෙ ශගශ මතප(දසනෙ)

පරුමක-නමලි-ශුමන-පුත පරුමක - නමලිය ලෙණෙ ශගශ

උපශක - නගමිකහ බරියය උපශික - ශිලය ලෙණෙ ශගශ

බතිය මනලිකචිය පුත පරුමක - අශමතහ ලෙණෙ ශගශ

(ලකුණු 05 යි )

(ඇ)

සි / පුවිය මහසෙන මහරජහ පුත සිරිමෙකවණ අබ මහරජහ වත ලෙගි
-තක තිණවතක වසහි / නකරහි උතරපසහි කළහුමතක නියමතනහි සිය අ-
-ච්ය කිණියෙනි නිකත කඩුබලගමකෙහි වසනක අමෙති පහෙජ සිවය-
-හ පුත දෙවයහ යහිසපවය නවවුහෙරකෙහි දින අරියව
-ස වටවි, දෙහකඩ දස අමණක වී ඉව ස අමණක
උදි ඉව බයලි දස අමණ ඉව / මෙදෙහකඩ දස අ-
-මණක වි පිටදඩහසහි වෙඪ අකලහසහි වෙඪ ම-
-දෙහසහි වෙඪ පවිසිය අමණක වි ඉව |

(ලකුණු 06 යි )